**<u>සිංහල පරිවර්තනය</u>**

| PACKWELL LANKA (PVT) LIMITED | | |
|---|---|---|
| සංශෝධන අංකය | දිනය | ලිපි අංකය: PW/ACC/01 |
| 1 | 01-01-2019 | පිටු 8 න් 1 |
| **අල්ලස් සහ දූෂණ විරෝධ ප්‍රතිපත්ති ප්‍රකාශය** | | |

පැක්වෙල් එහි ව්‍යාපාර කටයුතු කෙරෙහි ආචාර ධර්ම චර්යා ප්‍රමිතින් සහ අවංකත්වය උසස් අන්දමින් අදාල කර ගැනිමට ඇප කැප වි ඇත. පැක්වෙල් ආයතනය වෙනුවෙන් ක්‍රියාකරන සෑම සේවකයෙකුම සහ පුද්ගලයෙක්ම සමාගමේ ව්‍යාපාර කටයුතු අවංකව සහ වෘත්තිමය වශයෙන් පවත්වාගෙන යෑමට වගකිව යුතුවේ.

අල්ලස් සහ දූෂණ යහපාලනයට ක්‍රම ක්‍රමයෙන් පිඩා කරමින් සහ නිදහස් වෙළඳ පොලවල් කෙරෙහි වැරදි ප්‍රතිරූපයක් මවා පාමින් ව්‍යාපාර කෙරෙහි අනර්ථකාරි බලපෑමක් ඇතිකරන බව පැක්වෙල් අදහස් කරයි.

ව්‍යාපාර විනිවිද පෙනෙන ලෙස සහ ආචාර ධර්මානුකුලව කරගෙන යෑමෙන් සහ අප අංශ වල අවංක, විවෘත සහ සාධාරණ තරගයක් ඇති බව සහතික කිරිමට සහයෝගය දැක්විමෙන් පැක්වෙල් ප්‍රතිලාභ ලබයි. එහි සම ක්‍රියාකාරි ක්ෂෙත්‍රයක් ඇත.

පැක්වෙල් එහි සේවකයින් හෝ වෙනත් ඕනෑම පුද්ගලයන් හෝ සමාගම සඳහා හෝ ඒ වෙනුවෙන් ක්‍රියාකරන වෙනත් සමාගම් විසින් කරනු ලබන කුමන වර්ගයක හෝ අල්ලස් වලට ඉඩ නොතබයි. අධ්‍යක්ෂක මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය අල්ලස් වැලක් විම, නියාමනය කිරිම සහ තුරන් කිරිම සඳහා සාර්ථක ක්‍රම වේදයන් ක්‍රියාත්මක කිරිමට සහ බලාත්මක කිරිමට කැපවි ක්‍රියා කරයි.

පැක්වෙල් ආයතනය විසින් අල්ලස් විරෝධි ප්‍රතිපත්තියක් නිකුත් කර ඇත. අල්ලස් විරෝධි ප්‍රතිපත්තිය සියලුම සේවකයන්ට අදාල වන අතර ප්‍රතිපත්තියට ඔවුනොවුන්ගේ හුරුපුරුදු විම සහ අනුගතවිමට ඔවුන්ගෙන් ඉල්ලා සිටි.

අල්ලස යනු යම් පුද්ගලයෙකු හෝ සමාගමක් විසින් අනිසි අන්දමින් මහජන හෝ සංයුක්ත කටයුතු හෝ රාජකාරින් කරවා ගැනිම පිනිස (ඍජුව හෝ වක්‍රව) පෙළඹවිමට හෝ බලපෑම් කිරිමට පිරිනමන, දෙනු ලබන හෝ ගනු ලබන මුල්‍යමය වාසියක් හෝ වෙනත් පරිත්‍යාගයකි.

යම් සේවකයෙකු විසින් පැක්වෙල් අල්ලස් විරෝධි ප්‍රතිපත්තිය උල්ලංඝණය කිරිම විනය ක්‍රියාමාර්ගයකට මග සලසන අනිසි හැසිරිමක් අනාවරනය කර ගැනිමේ සහ වහාම සේවයෙන් පහ කිරිමට ඉඩ සලසන ක්‍රියාවකට හේතු නිර්මාණය කිරිමක් ලෙස සලකනු ලබයි.

පැක්වෙල් ආයතනයේ අල්ලස් විරෝධි අරමුණු වලට සහයෝගයක් නොදක්වන සේවා සපයන්නන්, ඒජන්ත වරුන් හෝ නියෝජිතයන් සමග පැක්වෙල් ආයතනය ව්‍යාපාර කටයුතු නොපවත්වනු ඇත.

පැක්වෙල් ආයතනයේ අල්ලස් විරෝධි වැඩ පිළිවෙලේ සාර්ථකත්වය රඳා පවතිනුයේ සෑම කෙනෙක්ම අල්ලස අනාවරනය කර ගැනිමට සහ එය අතුගා දැම්මට ඔවුන්ගේ කොටස නිසි පරිදි ඉටු කිරිමයි. එහෙයින් ඕනෑම සැක කටයුතු ක්‍රියාවක් සමාගමේ මානව සම්පත් කළමණාකරු වෙත වාර්ථා කරන ලෙසට සියලුම සේවකයන් සහ පැක්වෙල් සමග සහ පැක්වෙල් වෙනුවෙන් ක්‍රියා කරන අන් අය දිරි ගන්වනු ලැබේ.

**අල්ලස් සහ දූෂන විරෝධි ප්‍රතිපත්තිය**

පැක්වෙල් ආයතනයේදි නිවැරදි දේ නිවැරදි ආකාරයට කිරිමට අපි බැඳි ඇත්තෙමු. අවංක භාවයේ සත්‍ය භාවයේ උසස්ම ප්‍රතිපත්තින් පවත්වා ගෙන යන බවට සහතික කිරිම පිනිස පැක්වෙල් සමාගමක් වශයෙන් ඔසවා තබන ප්‍රමිතින් සහ චර්යාවන් අපගේ ආචාර ධර්ම සහ චර්යා පද්ධතිය විදහා දක්වයි. නව අල්ලස් පනත විසින් දැඩි නිති ඉදිරිපත් කර ඇති බැවින් වෙන කවරදාවකටත් වඩා මෙය වැදගත් වනු ඇත.

ඕනෑම ආකාරයක අල්ලස් හෝ දූෂණ ගෙවිම් දිම හෝ ලබා ගැනිම වෙනුවෙන් අප ශුන්‍ය ඉඩ ප්‍රවේශයක් ක්‍රියාත්මක කරන්නෙමු. සේවකයෙකු හෝ සමාගම වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් ඕනෑම අයෙකු වුවද කරනු ලබන මෙම වර්ගයේ හැසිරිම් සම්පූර්ණයෙන්ම තහනම් වේ.

සාමාන්‍ය ව්‍යවහාරය පරිදි මෙම ප්‍රතිපත්තිය පිළිගත හැක්කේ කුමක්ද නොහැක්කේ කුමක්ද යන්න ගෙන හැර පායි. එසේ වුවද යම් හැසිරිමක් අල්ලස් ගණයට වැටෙන්නේද යන්න පිළිබඳව ඔබට යම් සැකයක් ඇත්නම් එම කාරණය මෙම ප්‍රතිපත්තිය පිළිබද ප්‍රධාන අනුකූලතා නිළධාරි වන සමාගම් මානව සම්පත් කළමණාකරු වෙත යොමු කළ යුතුය.

යමුනු අංගම්මන්
කළමණාකාර අධ්‍යක්ෂක

**පටුන**

1. මෙම ප්‍රතිපත්තිය පිළිබඳව
2. එකග විය යුත්තේ කවුරුන්ද?
3. ඔබ එකග වන්නේ කෙසේද?
4. ඔබ එකග නොවන්නේ නම් කුමක් වේද?
5. ඔබට කළ නොහැක්කේ කුමක්ද?
6. සැපයුම් කරුවන් සහ කොටස් කරුවන් ඉවත්ව යැම: ලැබිය යුතු උද්යෝගය
7. තැගි, ආගන්තුක සත්කාර සහ සංග්‍රහ
8. දේශපාලන සහ පුණ්‍යමය ආධාර

## 1. මෙම ප්‍රතිපත්තය පිළිබඳව

අප සියලු දෙනාම සෑම ආකාරයකින්ම අල්ලස් වැලැක්වීමට කළ යුත්තේ කුමක්ද යන්න පිළිබඳව මෙම ප්‍රතිපත්තියේ විදහා දක්වයි. යම් තීරනයකට හෝ ප්‍රථිඵලයකට බලපෑම් කිරීමේ අරමුනින් කරන ඕනෑම ගෙවීමක්, ප්‍රතිලාභයක් හෝ ත්‍යාගයක් අල්ලසක් යන්නෙහි අඩංගු විය හැක. අල්ලස සෑමවිටම විශාල වටිනාකමකින් යුක්ත එකක් නොවීමට පුලුවන. එය ක්‍රීඩා තරගයක් සඳහා දෙන දිවා භෝජන සංග්‍රහයක් හෝ ආරාධනයක් විය හැක.

පැක්වෙල් අදාල ව්‍යවස්ථාව යටතේ ආයතනය වෙනුවෙන් ක්‍රියාකරන යම් අයෙකු විසින් තව අයෙකුට අල්ලස් හෝ දූෂණ ගෙවීම් නොකරන බවට, ප්‍රදානය නොකරන බවට, ඉල්ලා නොසිටින බවට, හෝ ලබා නොගන්නා බවට සහතික වෙමින් එහි බැඳීම් සමග අනුගත වීමට සම්පූර්ණයෙන්ම කැප වී ඇත.

ඔබ ඉදිරිපත් වී ඇති යම් අවස්ථාවක් සම්බන්ධයෙන් ඔබට යම් සැකයක් කවර අවස්ථාවකදී වුවද ඇතිවුවහොත් සෑමවිටම උපදෙස් පතන්න. පළමු අවස්ථාවේදීම ඔබ දුරකථන අංක 0112635382 යටතේ දිගු අංක 230 න් හෝ gihan@packwell.lk ඊමේල් ලිපිනය ඔස්සේ මානව සම්පත් කළමණාකරු ඇමතිය යුතුය.

## 2. එකග විය යුත්තේ කවුරුන්ද?

සීමාසහිත පැක්වෙල් ලංකා (පුද්ගලික) සමාගමේ අල්ලස් විරෝධි ප්‍රතිපත්තිය සියලුම පැක්වෙල් සේවකයන්ට, ඒජන්ත වරුන්ට, අතරමැදියන්ට, උපදේශකයන්ට, බෙදාහරින්නන්ට, උප කොන්ත්‍රාත් කරුවන්ට, සැපයුම් කරුවන්ට සහ ලෝකයේ කොහේ හෝ සිට ක්‍රියාකරන සමාගම් ව්‍යාපාර හවුල් කරුවන්ට බලාත්මක වන නියෝගයක් වේ.

ඔබ ප්‍රමානවත් වේලාවක් රැගෙන මෙම ප්‍රතිපත්තිය කියවා ඊට අනුගත වීම වැදගත් වේ. මොනයම් අයුරක හෝ ඕනෑම අල්ලසක් වැලැක්වීම, සොයා ගැනීම, සහ වාර්ථා කිරීම සියලුම පැක්වෙල් ලංකා සේවකයින්ගේ සහ පැක්වෙල් ආයතනයේ පාලනයට නතු වන සියලුම පුද්ගලයන් සහ ආයතන සතු වගකීමකි. අල්ලස් සම්බන්ධ ඕනෑම සැක සහිත දෙයක් වාර්ථා කිරීමට සුදුසු රහස්‍ය මාර්ග සේවකයින් සහ ව්‍යාපාර හවුල් කරුවන් සඳහා ස්ථාන පවතින අතර එම ස්ථාන මෙම ප්‍රතිපත්තියේ පසුවට විස්තර කර ඇත.

මෙම ප්‍රතිපත්තියට එකග විමට නොහැකි ඕනෑම අපොහොසත් විමක් තදින්ම සලකා බලන අතර එය විනය ක්‍රියා මාර්ගයකට හේතු විය හැක.

**3. ඔබ ඊට එකග වන්නේ කෙසේද?**

ඔබ මෙම ප්‍රතිපත්තිය කියවා එහි කොන්දේසි වලට බැදිය යුතුය. ඔබ මෙම ප්‍රතිපත්තියට එකග වන්නේද යන්න පිළිබදව ලිඛිත සනාථ කිරිමක් ඔබගෙන් ඉල්ලා සිටිමට ද පුලුවන.

**4. ඔබ මෙම ප්‍රතිපත්තියට එකග නොවන්නේ නම් කුමක් වේද?**

සේවකයින සදහා : අල්ලස් පිළිබද මොනයම් ආකාරයක හෝ ඕනෑම ක්‍රියාවක් පිළිගත නොහැක. අල්ලස් විරෝධි ප්‍රතිපත්තිය පිළි පැදිමට අපොහොසත් වන ඕනෑම අයෙකුට විරුද්ධව සේවයෙන් පහ කිරිම දක්වා සහ සේවයෙන් පහ කිරිම ඇතුලත් විනය ක්‍රියා මාර්ග ගැනිමට අප විසින් සලකා බලනු ඇත.

**5. ඔබට කළ නොහැක්කේ කුමක්ද?**

**තහනම් හැසිරිම**

පහත දැක්වෙන හැසිරිම් මෙම ප්‍රතිපත්තිය යටතේ සම්පූර්ණයෙන් තහනම් වේ.

- ඕනෑම අවසරයක් හෝ බලපත්‍රයක් ලබා ගැනිම සදහා නිළධාරින්ට කරනු ලබන නිළ නොවන ගෙවිම් කිරිම:

- ඔබ දන්නා හෝ පනත යටතට ගැනෙන ඕනෑම වරදවල් ඇතුලුව ඕනෑම දූෂණයක හෝ අනිතික හැසිරිමක නිරත වි ඇති විශ්වාස කිරිමට තරම් ප්‍රමාණවත් කාරණා සහිත තුන්වන පාර්ශවයක් හෝ සැපයුම් කරුවෙකු පැක්වෙල් ආයතනය වෙනුවෙන් ක්‍රියා කිරිමට පත් කිරිම.

- දොරවල් විවෘත කිරිමට තිරකුරුවකු වශයෙන් අදහස් කරන ඕනෑම තුන්වන පාර්ශවයකට ගෙවිම් කිරිම.

**පහසුකම් ගෙවීම්**

(පහසුකිරීම, ඉක්මන් කිරීම, අත මිට මෙලවීම හෝ ග්‍රීස් ගෙවීම්) චර්යාත්මක හෝ අවශ්‍ය කටයුත්තක හෝ සේවා මට්ටමක කාර්ය සාධනය අත්කර ගැනිමට හෝ කඩිනම් කර ගැනිමට අල්ලසක් වශයෙන් සාමාන්‍යයෙන් සුලු මට්ටමේ නිළධාරීන්ට කරන සුලු මුදල් ගෙවීම් ඇතුලු ඕනැම ගෙවීමක් පහසුකම් ගෙවීම් වේ.

පැක්වෙල් සේවකයන් හෝ ව්‍යාපාර හවුල් කරුවන් කවරදාක වත් පහසුකම් ගෙවීම් ඇතුලු ඕනැම වර්ගයක අල්ලස් දීම, ගෙවීම, අගය කිරීම හෝ පිළිගැනිම නොකළ යුතුය.

<u>ව්‍යතිරේකයන්</u> : පහසුකම් සැලසීමේ ගෙවීම් සම්බන්ධයෙන් ඇති එකම ව්‍යතිකරේකය වන්නේ ඔබගේ ජිවිතයට යම් අනතුරක් ඇති අවස්ථා පමනි. එවැනි අවස්ථාවක පහසුකම් සැලසීමේ ගෙවීම් කරන්නේ නම් ප්‍රායෝගිකව හෝ හැකි ඉක්මනින් එය සටහන් කිරීමට හැකි වන පරිදි සමාගම් මානව සම්පත් කළමණාකරුට වාර්ථා කළ යුතුය.

සමාගම වෙනුවෙනී චෝදනාත්මක පහසුකම් සැලසීමේ ගෙවීම කර ඇති ඔනැම අවස්ථාවක පැක්වෙල් සේවකයින් සහ ව්‍යාපාර හවුල් කරුවන් විසින් සේවක සභාය වැඩසටහන් සේවක සහය මධ්‍යස්ථානය හරහා වාර්ථා කළ යුතුය.

6. **සැපයුම් කරුවන් සහ හවුල් කරුවන් ඉවත්ව යැම**

සැලකිය යුතු අල්ලස් හානි ඇති විය හැකි අවස්ථා වලදී පහත දැක්වෙන කටයුතු කිරීමට පෙර සියලුම ව්‍යාපාර ඒකක සුදුසු අල්ලස් විරෝධි අනුගත කාරණා සම්බන්ධයෙන් සමාගම් ලේකම්ගේ උපදෙස් පැතිය යුතුය.

- නව සැපයුම් කරුවෙකු පත් කිරීමේදී
- හවුල්කාරීත්වයට ඇතුල් වීමේදී
- සමාගම වෙනුවෙන් ක්‍රියා කිරීමට ඒජන්ත වරයෙකු පත් කිරීමේදී හෝ
- නව කොන්ත්‍රාත්තුවකට ඇතුල් වීමේදී හෝ දැනට පවතින කොන්ත්‍රාත්තුවේ කොන්දේසි සංශෝධනය කිරීමේදී

**සැලකිය යුතු අල්ලස් හානි**

1. අප වෙනුවෙන් සෘජුවම හෝ වක්‍රාකාරයෙන් ඕනැම දැඩි අවදානම් කලාපයක සේවා සැපයීම පවත්වාගෙන යැමට භාර ගෙන ඇති වැඩ වල යෙදී සිටින

2. දැඩි අවදානම් කලාපයන් අතර භාන්ඩ තීරයන් හරහා යැවීමේ නිරතව සිටින සේවාවන්

3. පැක්වෙල් ආයතනය වෙනුවෙන් භාණ්ඩ ආනයනය හෝ අපනයනය සම්බන්ධ ව්‍යාපාර හවුල්කරු ගාස්තු ගෙවීම්, බදු හෝ ගෙවීම් වල නිරත සේවාවන්

4. නිළ බලපත්‍ර, අවසර හෝ රාජ්‍ය නිළධාරිනගෙන් හෝ ඒජන්ත වරුන්ගෙන් ගිවිසුම් ලබා ගැනීමේ ව්‍යාපාර හවුල්කරුවන් නිරත සේවාවන් හෝ,

5. සාමාන්‍ය ප්‍රමාණයට වඩා වැඩි අවදානමක් සහිත දූෂණ හෝ අල්ලස් ඇති බවට සැක කළ හැකි ඕනැම විශේෂ හේතු ඇත.

7. **ත්‍යාග, ආගන්තුක සත්කාර සහ සංග්‍රහ**

ඔවුනොවුන් සත්භාවයෙන්, අපක්ෂපාතීත්වයෙන් සහ අවංක භාවයෙන් හැසිරීම සියලුම පැක්වෙල් සේවකයින්ගෙන් අපේක්ෂා කරයි. **ඒ අනුව ත්‍යාග, ආගන්තුක සත්කාර සහ සංග්‍රහ පිළිබඳ මෙම නීති අනුගමනය කරන ලෙස සියලුම පැක්වෙල් සේවකයිනගෙන් ඉල්ලා සිටිනු ලැබේ.**

ඔබ විසින් වෘත්තිය දක්ෂතා පිළිබඳ උසස් ප්‍රමිතීන් පවත්වා ගෙන යා යුතු අතර ඔබ විසින්ම වංක භාවයේ සැකයට භාජනය නොවන අන්දමින් හෝ ඔබ විසින් ඔබගේ පෞද්ගලික ඕනෑ එපාකම් සහ ඔබගේ කාර්යන් අතර ගැටුම් කාරි තත්වයකට පත් වන අන්දමින් ක්‍රියා නොකළ යුතුය. ත්‍යාග සහ සංග්‍රහ ප්‍රදානයක් වශයෙන් දීම සහ ගැනීම, අනුග්‍රහ පූර්වක සත්කාරයක් සඳහා පෙළඹවීම හෝ ධෛර්යමත් කිරිම හෝ නුසුදුසු හෝ වංක හැසිරීම තදින්ම තහනම් වනු ඇත. විශේෂයෙන්ම ටෙන්ඩර් ක්‍රියාවලියක් සිදුවන කාලයකදී හෝ කොන්ත්‍රාත්මය සාකච්ඡා පවතින කාලයකදී එවැනි ත්‍යාග හෝ සංග්‍රහ එම ක්‍රියා වලින්ට සහ සාකච්ජා වල තීරණ වලට බලපෑමක් ඇති කිරීමේ යම් අවබෝධාත්මක අවදානමක් ඇත්නම් ත්‍යාග, ආගන්තුක සත්කාර හෝ සංග්‍රහ දීම හෝ පිළිගැනීම නොකළ යුතුය.

පැක්වෙල් සේවකයින්ගේ ක්‍රියාවන් නිරික්ෂණයට භාජනය නොවී සිටිමට හැකි වන සහ සමාගම, ඔබ හෝ කොන්ත්‍රාත් කරුවන් හෝ සැපයුම් කරුවන් ඇතුලුව වෙනයම් තුන්වන පාර්ශවයක් යම් අසීරුතාවයකට පත් කිරිමට හේතුවක් නොවන්නේ නම් එය ඉතා වැදගත්ය.

**ආගන්තුක සත්කාරය/ සංග්‍රහ**

පැක්වෙල් සේවකයින්ට අවස්ථානුකුලව සැපයුම් කරුවන්ගෙන් හෝ අන් අයගෙන් සංයුක්ත ආගන්තුක සත්කාර හෝ සංග්‍රහ අවස්ථා වලදී ආරාධනා ලැබිය හැක.

- සේවකයන් හෝ පිරිස් බාහිරින් සේවා සැපයිමට පැමිණෙන සැපයුම් කරුගෙන් නම්,
- සැපයුම් කරු පැක්වෙල් සේවකයිනගේ කිසිම නවාතැන් හෝ ප්‍රවාහන වියදම් (සුලු ප්‍රමාණයකට වඩා) නොගෙවන්නේනම්,
- සංග්‍රහ සහ/ හෝ එය පිළිගැනිම පරිත්‍යාගයක්, පෙළඹවිමක් හෝ වාසියක් ලබා ගැනිමට කරන දිරිමත් කිරිමක් හෝ කැමැත්ත ලබා ගැනිම සදහා කරන සත්කාරයක් ලෙස අරථ කථනය කළ නොහැක්කේ නම්,
- එය අනිසි අධික ලෙස වියදම් දැරිමක් ප්‍රමාණය ඉක්මවා යැමක් නොවන්නේ නම්,

එවැනි අවස්ථා වලදී පමණක් ආගන්තුක සත්කාර හෝ සංග්‍රහ පිළිගැනිමට පුලුවන.

8. **දේශපාලන සහ පුණ්‍යමය ආධාරයන්**

පැක්වෙල් ආයතනය දේශපාලන සංවිධාන වලට හෝ ස්වාධීන අපේක්ෂකයින්ට ආධාර හෝ පරිත්‍යාග නොකරන අතර කිසිම දේශපාලන වියදමක් නොදරනු ඇත.

ව්‍යාපාර ගනුදෙනුවක වාසි ලබා ගැනිමට නොකරන්නක් යන්න මත පිහිටා පෞද්ගලික ආධාර කිරිමට සේවකයින්ට ඇති අයිතියට අප ගෞරව කරන්නෙමු.

ව්‍යාපාර ශුභ සිද්ධියට හෝ කොටස් හිමිකරුවන්ට සහ සේවකයින්ට බලපාන කාරණා සම්බන්ධයෙන් ව්‍යාපාරයට බලපාන නිති සහ ව්‍යවස්ථා සංවර්ධනය කිරිමට සහයෝගය දැක්විමක් වශයෙන් රජයට සහ අන් අයට පැක්වෙල් සිය අදහස් සංනිවේදනය කරනු ඇත.